ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2024
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2024

| | | | | | |
|---|---|---|---|---|---|
| 13 ශ්‍රේණිය | 22 | S | I | භූගෝල විද්‍යාව I<br>Geography I | කාලය : පැය තුනයි<br>Time : Three hours |

අමතර කියවීම් කාලය - මිනිත්තු 10

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලබාදීමේ දී පමුඛතාවය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

උපදෙස් :

- ❖ මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විත වේ. I කොටස බහුවරණ ප්‍රශ්න 40 කින් සමන්විත වන අතර, ඒවාට පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතු ය.
- ❖ I කොටසේ නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු එක බැගින් හිමිවේ.
- ❖ II කොටසෙහි ප්‍රශ්න දෙකටම පිළිතුරු සැපයිය යුතුය.
- ❖ III කොටස ප්‍රශ්න හතරකින් සමන්විත වන අතර තෝරාගත් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
- ❖ I, II සහ III කොටස්වල පිළිතුරු පත්‍ර එකට අමුණා භාර දිය යුතු ය.

01. ශ්‍රී ලංකා 1: 50000 මෙට්‍රික් සිතියම් කොටසක දිග , පළල නිවැරදිව දැක්වෙනුයේ,

(1) 40km x 25km (2) 40cm x 25cm (3) 80cm x 50cm

(4) 80km x 50km (5) 25km x 40km (..................)

02. 1: 50000 මෙට්‍රික් සිතියම තුළ කඩ ඉරි පමණක් යොදාගෙන ඇති පරිපාලන මායිම් වර්ගය වනුයේ,

(1) පළාත් මායිම් (2) දිස්ත්‍රික් මායිම් (3) නගරසභා මායිම්

(4) උප දිසාපති කොට්ඨාස මායිම් (5) ගැමිරික කලාප මායිම් (..................)

03. ශ්‍රී ලංකා 1: 50000 මෙට්‍රික් සිතියමක අක්ෂාංශ හා දේශාංශ රේඛා කැපී යන ස්ථානයන් දක්වා ඇත්තේ,

(1) නිල් පැහැති රේඛා වලිනි (2) කළු පැහැති කතිර සළකුණෙනි.

(3) කළු පැහැති තරුවකිනි. (4) සිතියමේ දක්වා නැත.

(5) තරු ලකුණකිනි. (..................)

04. මෙට්‍රික් සිතියමක දක්වෙන ප්‍රධාන සංස්කෘතික ලක්ෂණ කාණ්ඩ තුන දක්වෙන පිළිතුර වනුයේ,

(1) පරිපාලන මායිම්, මාර්ග , භූ විෂමතාවය

(2) මාර්ගජාල , භූමි පරිභෝජනය. ජනාවාස

(3) දුම්රිය මාර්ග, ජලවහනය, ජනාවාස

(4) සංස්කෘතික ලක්ෂණ, ජලවහනය, භූමි පරිභෝගය

(5) ජලවහනය, දුම්රිය මාර්ග, ජනාවාස (..................)

05. භූගෝලීය තොරතුරු පද්ධතියක මූලිකාංගයක් වන දෘඩාංග වලට අයත් වන්නේ,

(1) පරිගණකය, ආදාන උපාංග, ප්‍රතිදාන උපාංග, ගබඩා උපාංග

(2) පරිගණකය, දත්ත, ආදාන උපාංග, ප්‍රතිදාන උපාංග

(3) පරිගණකය, මෘදුකාංග ආදාන උපාංග, දත්ත

(4) පරිගණකය, ආදාන උපාංග, මෘදුකාංග, ගබඩා උපාංග

(5) පරිගණකය, දත්ත, මෘදුකාංග, ප්‍රතිදාන උපාංග (..................)

06. විසරන සටහන අඳිනු ලබන්නේ අවශ්‍යයෙන්ම කවර කරුණක් අවබෝධය පිණිස ද?

(1) විචල්‍යයක ඇතිවන වෙනස (2) විචල්‍ය දෙකක් අතර ඇති සම්බන්ධය

(3) විචල්‍යවල පැතිරීම හා ව්‍යාප්තිය (4) විචල්‍ය වෙනස හා අඩුවීම.

(5) විචල්‍යක පරාසය දැක්වීමට (..................)

07. දත්ත වගුවක ඉතාමත් අත්‍යවශ්‍ය අංග දෙකක් නිවැරදිව දක්වනුයේ,

(1) වගුවේ අංකය සහ වර්ෂය (2) වර්ෂය හා මාසය

(3) මාතෘකාව හා මූලාශ්‍රය (4) පිළියෙළ කළ ආයතනයේ නම සහ වර්ෂය

(5) මෘතාකාව හා වර්ෂය (.................)

08. භූගෝලීය තොරතුරු පද්ධති වලදී අවකාශීය නොවන දත්ත ඉදිරිපත් කිරීමේ දී යොදා නොගන්නා මිනුම් වර්ගය වනුයේ,

(1) නාම මාත්‍රික දත්ත (2) ක්‍රමික දත්ත (3) ප්‍රාන්තර දත්ත

(4) අනුපාත දත්ත (5) දෛශික දත්ත (.................)

09. අවකාශීය ව්‍යාප්තිය දක්වන සංඛ්‍යා දත්ත නිරූපණය කිරීමේදී සංඛ්‍යාත්මක සිතියම් භාවිත කරනු ලැබේ. සංඛ්‍යාත්මක සිතියම් පමණක් ඇති වරණය තෝරන්න.

(1) සම සංඛ්‍යා සිතියම්, බෙදන ලද වෘත්ත, සමානුපාතික වෘත්ත

(2) සම සංඛ්‍යා සිතියම්, රේඛාංකිත සිතියම් තිත් සිතියම්

(3) රේඛාංකිත සිතියම්, තිත් සිතියම්, තේමා සිතියම්

(4) තේමා සිතියම්, ධාරා සිතියම්, ජනගහන සිතියම්

(5) තිත් සිතියම්, ධාරා සිතියම්, ජනගහන සිතියම් (.................)

10. ධාරා සිතියමක් යොදා ගන්නේ පහත සඳහන් කවර අවස්ථාවකදී ද?

(1) විචල්‍යවල ආන්තික වෙනස්කම් පවතින විට

(2) ජන සංඛ්‍යාවක ඝනත්වය දැක්වීමට අවශ්‍ය වූ විට

(3) ජන සංඛ්‍යාවක සංක්‍රමණය දැක්වීමට අවශ්‍ය වූ විට

(4) ජන සංඛ්‍යාවක ව්‍යාප්තිය දැක්වීමට අවශ්‍ය වූ විට

(5) ජන සංඛ්‍යාවක ව්‍යුහය දැක්වීමට අවශ්‍ය වූ විට (.................)

11. ශ්‍රී ලංකාවේ පැරණිතම පාෂාණ කලාපය ලෙස සලකනුයේ,

(1) උස්බිම් සංකීර්ණය (2) විජයානු සංකීර්ණය (3) මයෝසීන හුණුගල්

(4) නිරිත දිග කාණ්ඩය (5) වන්නි සංකීර්ණය (.................)

12. ඉන්දියාවෙන් ලංකාව වෙන්වීම සිදුවුණු භූ විද්‍යාත්මක කාලය වනුයේ,

(1) මයෝසින (2) හොලෝසීන (3) ජුරාසික

(4) කේම්බ්‍රීය (5) චාතුර්තික (.................)

13. පාංශු තෙතමනය ලෙස පවතින ජලය හඳුන්වනුයේ,

(1) ජෛව ජලය (2) ජලාකර්ෂණ ජලය (3) ගුරුත්වාකර්ෂණ ජලය

(4) කේෂාකර්ෂණ ජලය (5) උල්කා ජලය (.................)

14. ගංගාවක පරිණත අවධියේ දී නිර්මාණය වනු ලබන භූ ලක්ෂණයක් වනුයේ,

(1) ගංගා විලෝපනය (2) පුළුල් නිම්න (3) දියලු අවාන්

(4) පිටාර තැන්න (5) නෙත්ති තෙරු (.................)

15. යමහල් දූපත් ආශ්‍රිතව නිර්මාණය වන කොරල් පර හඳුන්වනුයේ,

(1) යමහල් පර (2) ගැටිපර (3) බාධක පර

(4) අතොළු (5) හිරිලබ (.................)

16. ලෝකයේ වැඩිම වර්ෂණයක් සිදුවෙනු ලබන මහද්වීපය වනුයේ,

(1) අප්‍රිකාව (2) ආසියාව (3) යුරෝපය

(4) දකුණු ඇමරිකාව (5) ඕස්ට්‍රේලියාව (.................)

17. ගෝලීය දේශගුණ වෙනස්වීම් පිළිබඳව රියෝ සමුළුවට ශ්‍රී ලංකාව ඇතුළත් වූ වර්ෂය වනුයේ,

(1) 1993 (2) 1994 (3) 1995

(4) 1996 (5) 1999 (.................)

18. පෘථිවි වායුගෝලයේ උෂ්ණත්වය අඩුම ස්තරය වනුයේ,

(1) පරිවර්තී ගෝලය (2) අපරිවර්ති ගෝලය (3) මෙසෝ ගෝලය

(4) තාප ගෝලය (5) අජටගෝලය (.................)

19. කිරිගරුඬ (මාබල්) නිර්මාණය වනුයේ කුමන පාෂාණයක් විපරිත වීමෙන් ද?

(1) ග්‍රැනයිට් (2) වැලිගල් (3) හුණුගල් (4) සිස්ට් (5) මිනිරන්

(.................)

20. ඉහළ නගින වායුව සනීභවන මට්ටම තෙක් සිසිල් වන අවස්ථාව හඳුන්වනුයේ,

(1) වියළි පතන සීඝ්‍රතාවය (2) තෙත් පතන සීඝ්‍රතාවය

(3) ස්ථරතාපී පතන සීඝ්‍රතාවය (4) පරිසර පතන සීඝ්‍රතාවය

(5) අස්තායි පතන සීඝ්‍රතාවය

(.................)

21. කොළඹට වඩා නුවර එළියේ උෂ්ණත්වය සාපේක්ෂව අඩු ය. මීට ප්‍රධාන හේතුව වන්නේ,

(1) අහසේ පවතින වළාකුළු ප්‍රමාණය (2) ශාක ගහන ව්‍යාප්තියේ වෙනසයි

(3) උච්චත්වයේ වෙනස යි. (4) ආර්ද්‍රතාවයේ වෙනස යි.

(5) මුහුදේ සිට ඇති දුර ප්‍රමාණය (.................)

22. මධ්‍යම පරිසර අධිකාරිය පිහිටවනු ලැබූ වර්ෂය වනුයේ,

(1) 1980 (2) 1981 (3) 1983 (4) 2000 (5) 2012

(.................)

23. පක්ෂිපාද ඩෙල්ටාවකට උදාහරණයක් වනුයේ,

(1) නයිල් ගඟ (2) සේන් ගඟ (3) ටයිබර් ගඟ

(4) මිසිසිපි ගඟ (5) ගංගා නම් ගඟ (.................)

24. භූ කම්පනයකදී භූ කම්පනය සිදුවන ස්ථානයට ලම්භකව පොළොව මතුපිට ඇති ලක්ෂ්‍ය හඳුන්වනුයේ,

(1) නාභිය (2) අපිකේන්ද්‍රය (3) කේන්ද්‍රය

(4) ලම්භ අක්ෂය (5) මස්තකය (.................)

25. උත්තරාර්ද්‍ර ගෝලයට වසන්ත විෂුවය උදාවනුයේ,

(1) ජූනි 21 (2) සැප්තැම්බර් 03 (3) දෙසැම්බර් 22

(4) මාර්තු 21 (5) ජූනි 05 (.................)

26. රටක ජන සංඛ්‍යා වර්ධන වේගය 2.1 ක් නම්, එරට තුළ ජන සංඛ්‍යාව දෙගුණ වීමට ගතවන කාලය වනුයේ,

(1) අවුරුදු 25 (2) අවුරුදු 33 (3) අවුරුදු 49

(4) අවුරුදු 100 (5) අවුරුදු 72 (.................)

27. ලෝකයේ ජනාධිකම ගංගා නිම්න පමණක් අයත් වන පිළිතුර වනුයේ,

(1) ඇමසන්, නයිල්. කොලරාඩෝ (2) ඇම්සන්, මරේඩාලිං, ලීනා

(3) කොලරාඩෝ, මැකන්සි, ඇමසන් (4) ගංගානම්, නයිල්, හොවැංහෝ

(5) කොලරාඩෝ, ඇමසන්, මරේඩාලිං (.................)

28. උත්තරධ්‍රැවය ආශ්‍රිත ජීවත්වනු ලබන ආදිවාසී ජන කණ්ඩායම වනුයේ,

(1) ඇබොරජින්වරු (2) පිග්මිවරු (3) ඇස්කිමෝවරු

(4) රතු ඉන්දියානු (5) අයිනුස්වරු (.................)

29. ලෝක ජන සංඛ්‍යාව වර්ධනය වේගවත් වීම සිදු වූයේ,

(1) ක්‍රි.පූ. 8000දී ය. (2) ක්‍රි.පූ. 1 දී ය. (3) 1650 දී ය.

(4) 1950 දී ය. (5) 2000 දී ය. (.................)

30. ශ්‍රී ලංකාවේ අඩුම ජන සංඛ්‍යාවක් ජීවත් වන පළාත වනුයේ,

(1) වයඹ පළාත (2) උතුරු පළාත (3) ඌව පළාත

(4) උතුරු මැද පළාත (5) දකුණු පළාත (.................)

31. කලාපීය සංවිධාන අතරින් කලාපිය සහයෝගීතාවය පමණක් අරමුණ කර නොගෙන පිහිටුවන ලද සංවිධානය වනුයේ,

(1) උතුරු ඇමරිකානු නිදහස් වෙළඳ ගිවිසුම

(2) අප්‍රිකානු ආර්ථික කොමිසම

(3) යුරෝපා සංගමය

(4) අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංගමය

(5) දකුණු ආසියානු කලාපීය සහයෝගීතා සංවිධානය (.................)

32. ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයිනීගේ ප්‍රධාන අරමුණ වූයේ,

(1) වෛද්‍ය ප්‍රතිකාර සඳහා (2) නැදෑ හිතවතුන් බැලීමට

(2) ව්‍යාපාර කටයුතු සඳහා (4) අධ්‍යාපනය ලැබීමට

(5) විවේකය සහ විනෝදය සඳහා (.................)

33. සාර්ක් සංවිධානයේ ආරම්භක සාමාජිකයෙකු නොවන්නේ,

(1) බංගලාදේශය (2) ඇෆ්ගනිස්ථානය (3) නේපාලය

(4) මාලදිවයින (5) ශ්‍රී ලංකාව (.................)

34. වර්තමානය වන විට ලොව වැඩිපුරම නිෂ්පාදනය වන ධාන්‍ය වර්ගය වනුයේ,

(1) සහල් (2) තිරිඟු (3) බාර්ලි (4) ඉරිඟු (5) සෝයා

(.................)

35. වර්තමානය වන විට යපස් නිෂ්පාදනය අතින් ඉදිරියෙන්ම පසුවෙන රට වනුයේ,

(1) රුසියාව (2) ඕස්ට්‍රේලියාව (3) බ්‍රසීලය

(4) ඉන්දියාව (5) චීනය (.................)

36. එක්සත් ජාතීන්ගේ ලෝක සංචරණ සංවිධානයේ මූලස්ථානය පිහිටියේ

(1) ස්පාඤ්ඤයේ මැඩ්රිඩ් (2) ස්විට්සර්ලන්තයේ ජිනීවා

(3) පිලිපීනයේ මැනිලා (4) ඇ.එ.ජනපදයේ නිව්යෝර්ක්

(5) ඉන්දියාවේ දිල්ලි (.................)

37. මධ්‍යම ප්‍රමාණයේ නගරයක ජීවත් වෙතැයි අපේක්ෂා කරන ජන සංඛ්‍යාව වනුයේ,

(1) 20000 ට අඩු (2) 100000 - 1000000 අතර (3) 10000000 වැඩි

(4) 20000 - 100000 අතර (5) 1000000- 1000000 අතර (.................)

38. ක්‍රි.පූ. 3100 පමණ නයිල් නිම්නයේ ගොඩනැගුණු නගරය වනුයේ,

(1) මෙම්පිස් සහ ලක්සෝර් නගර (2) මොහෙන්ජදාරෝ නගරය

(3) එරිදූ නගරය (4) ඌර් නගරය

(5) හරප්පා නගරය (.................)

39. මහවැලි කලාපයට අයත් ඇලහැර දෙහිඅත්තකණ්ඩිය නගර අයත්වන මහවැලි කලාපය වනුයේ,

(1) G කලාපය, C කලාපය (2) H කලාපය , G කලාපය

(3) H කලාපය, B කලාපය (4) C කලාපය, B කලාපය

(5) තෙත් කලාපය හා C කලාපය

(.................)

40. ලෝකයේ ප්‍රධාන ධීවර බිම් අතරින් විශාලම ධීවර බිම වනුයේ,

(1) ගිණිකොණ දිග පැසිපික් (2) වයඹදිග පැසිපික්

(3) නැගෙනහිර ඉන්දීය සාගරය (4) ඊසානදිග අත්ලාන්තික්

(5) ඉන්දියන් සාගරය (.................)

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2024
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2024

| 13 ශ්‍රේණිය | 22 S II | භූගෝල විද්‍යාව II | කාලය : පැය තුනයි. Time : Three hours |
|---|---|---|---|

අමතර කියවීම් කාලය - මිනිත්තු 10

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලබා දීමේ දී ප්‍රමුඛතාවය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

**උපදෙස් :**

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකි.
- I කොටසින් අවම වශයෙන් ප්‍රශ්න 2 ක් වත් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

## I කොටස - භෞතික භූගෝල විද්‍යාව

01. (i) සුනාමි තරංගයක් සාමාන්‍ය සමුද්‍ර තරංගයකින් වෙනස් වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) සාගරික තරංග ක්‍රියාවලිය මගින් ඇති කරනු ලබන ඛාදිත භූ රූප දෙකක නිර්මාණ ක්‍රියාවලිය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) සාගරික තරංග ක්‍රියාවලිය මගින් ඇති කරනු ලබන නිධිසාධිත භූ රූප දෙකක නිර්මාණ ක්‍රියාවලිය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iv) තරංග ක්‍රියාවලිය මඟින් ශ්‍රී ලංකාවේ වෙරළ බඩ පරිසරයට සිදුකර ඇති බලපෑම් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

02. (i) පෘථිවි අභ්‍යන්තරයේ භූගත ජලය තැන්පත් වී ඇති ආකාර දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02)

(ii) භූගත ජලය ප්‍රයෝජනයට ගන්නා ආකාර තුනක් විස්තර කරන්න. (ලකුණු 06 )

(iii) ලෝකයේ ජල සම්පත කෙරෙහි බලපාන සාධක තුනක් විස්තර කරන්න. (ලකුණු 06)

(iv) ජල සංරක්ෂණය අවශ්‍යතාවය කෙරෙහි

a. බලපාන සාධක එකක්

b. ශ්‍රී ලංකාවේ ජල සම්පත් අධි භාවිතය සිදුවන ක්ෂේත්‍ර 03 ක් සවිස්තරාත්මකව පහදන්න. (ලකුණු 06)

03. (i) පෘථිවියේ තිරස් උෂ්ණත්ව ව්‍යාප්තියෙහි වෙනස්කම් ඇතිවීම කෙරෙහි බලපාන සාධක දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) පෘථිවියෙහි භූගෝලීය වශයෙන් දේශගුණයේ විවිධත්වයක් ඇතිවීම කෙරෙහි බලපාන සාධක තුනක් විස්තර කරන්න. (ලකුණු 06)

(iii) අන්තර් නිවර්තන අභිසරණ කලාපයේ ක්‍රියාකාරිත්වය පෘථිවි ආදර්ශ ගෝලයේ රූප සටහනක් යොදා ගනිමින් විස්තර කරන්න. (ලකුණු 06)

(iv) ශ්‍රී ලංකාවේ අවකාශිය වශයෙන් පවත්නා දේශගුණික වෙනස්වීම් කෙරෙහි බලපාන ප්‍රධාන සාධක දෙකක් නම් කර ඒවා දේශගුණය කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06)

04. (i) සපයා ඇති ශ්‍රී ලංකාවේ සිතියමෙහි නායයාම් වලට අතිශයින් අවදානමට ලක්වන දිස්ත්‍රික්ක හතරක් ලකුණු කර නම් කරන්න. (ලකුණු 02)

(ii) අවදානමට ලක්වන දිස්ත්‍රික්කවල නායයාම් ඇතිවීමට හේතුවන භෞතික සාධක දෙකක් සහ මානව සාධක දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(iii) ශ්‍රී ලංකාවේ නායයාම් ඇති වීම අවම කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග 03 ක් විස්තර කරන්න. (ලකුණු 06)

(iv) ශ්‍රී ලංකාව මුහුණ දෙනු ලබන ස්වභාවික ව්‍යසන අතරින් ගං වතුර ඇතිවීම සුලභ තත්වයකි. ගංවතුර මගින් ඇති කරන බලපෑම තිව්‍ර වීම කෙරෙහි බලපානු ලබන මානව ක්‍රියාකාරකම් තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

## II කොටස - මානුෂ භූගෝල විද්‍යාව

05. වර්ෂ 2000 සිට 2011 තෙක් ශ්‍රී ලංකාවේ ඇස්මේන්තුගත මධ්‍ය වාර්ෂික ජන සංඛ්‍යාව හා ස්වභාවික වර්ධනය පහත දැක්වේ.

| වර්ෂය | මධ්‍ය වාර්ෂික ජන සංඛ්‍යාව (දහස් ගණනින්) | ස්වභාවික වර්ධන අනුපාතිකය (ප්‍රතිශතය) |
|---|---|---|
| 2000 | 19,102 | 0.89 |
| 2001 | 18,797 | 0.87 |
| 2002 | 18,921 | 0.85 |
| 2003 | 19,173 | 0.83 |
| 2004 | 19,435 | 0.81 |
| 2005 | 19,644 | 0.79 |
| 2006 | 19,858 | 0.78 |
| 2007 | 20,039 | 0.98 |
| 2008 | 20,246 | 0.94 |
| 2009 | 20,450 | 0.90 |
| 2010 | 20,653 | 0.86 |
| 2011 | 20,869 | 0.93 |

මූලාශ්‍රය : ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

(i) ඉහත වගුවෙන් දැක්වෙන දත්ත අනුව ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා වර්ධනය ආශ්‍රිත ප්‍රවණතා දෙකක් දක්වන්න. (ලකුණු 02)

(ii) වගුවෙන් දැක්වෙන ජන විද්‍යාත්මක ප්‍රවණතාවට බලපෑ සාධක තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) පසුගිය දශක කිහිපය තුළ ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ ස්වභාවික වර්ධන අනුපාතිකය අඩු වීම කෙරෙහි බලපාන ලද හේතු තුනක් සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(iv) ශ්‍රී ලංකාවේ ජනගහනය ආශ්‍රයෙන් පවතින ප්‍රවණතා හා ගැටලු තුනක් සාකච්ඡා කරන්න. (ලකුණු 06)

06. 1950 සහ 2013 වසරවල ජනසංඛ්‍යාව අනුව ලෝකයේ විශාලතම නගර 15 ක තරාව වගු අංක 01 න් පෙන්වා ඇත.

වගු අංක 1

1950 සහ 2013 වසරවල ලෝකයේ විශාලතම නගර

| 1950 | | | 2013 | | |
|---|---|---|---|---|---|
| තරාව | නගරය (මිලියන) | ජනගහනය | තරාව | නගරය | ජනගහනය (මිලියන) |
| 1 | නිව්යෝර්ක් | 12.3 | 1 | ටෝකියෝ | 34.8 |
| 2 | ලන්ඩන් | 10.4 | 2 | ගුවාන්ෂු | 31.7 |
| 3 | රයින්- රූර් | 6.9 | 3 | ෂැන්හයි | 28.9 |
| 4 | ටෝකියෝ | 6.7 | 4 | ජාකර්තා | 26.4 |
| 5 | ෂැන්හයි | 5.8 | 5 | සියොල් | 25.8 |
| 6 | පැරිස් | 5.5 | 6 | දිල්ලි | 24.0 |
| 7. | බුවනොස් අයර්ස් | 5.3 | 7 | මෙක්සිකෝ සිටි | 23.8 |
| 8 | චිකාගෝ | 4.9 | 8 | කරච්චි | 22.7 |
| 9 | මොන්කව් | 4.8 | 9 | මැනිලා | 22.2 |
| 10. | කල්කටා | 4.6 | 10 | නිව්යෝර්ක් | 21.6 |
| 11. | ලොස් ඇන්ජලීස් | 4.0 | 11 | සාඕ පාවුලෝ | 21.5 |
| 12. | ඕසාකා | 3.8 | 12 | මුම්බායි | 21.4 |
| 13 | මිලාන් | 3.5 | 13 | බීජිං | 19.3 |
| 14 | බොම්බාය(මුම්බායි) | 3.0 | 14 | ලොස් ඇන්ජලිස් | 17.2 |
| 15 | මෙස්කෝ සිටි | 3.0 | 15 | ඕසාකා | 16.8 |

මූලාශ්‍රයः- Potter : et al (2004) and The Free Encydopedia

The Principal Agglomeration as of the world 2013

(i) වගු අංක 1 විමර්ෂණය කරමින්, ලෝකයේ විශාල නගරවල ජනගහනයේ සිදු වූ වෙනස්කම් තුනක් දක්වන්න. (ලකුණු 03)

(ii) සංවර්ධනය වෙමින් පවතින රටවල ශීඝ්‍ර නාගරීකරණය කෙරෙහි බලපාන හේතු හතරක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) ලෝකයේ සංවර්ධනය වන රටවල ශීඝ්‍ර නාගරීකරණය හා සම්බන්ධ ගැටලු 03 ක් සාකච්ඡා කරන්න. (ලකුණු 05)

(iv) ශ්‍රී ලංකාවේ මන්දගාමී නාගරික වර්ධනය කෙරෙහි බලපාන සාධක තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

07. (i) හරිත විප්ලවය යන්න හඳුන්වන්න. (ලකුණු 02)

(ii) හරිත විප්ලවය ආහාර නිෂ්පාදනයේ වර්ධනයට සහ පරිසරය කෙරෙහි ඇති කරන ලද බලපෑම කරුණු 04 ක් ඇසුරින් පහදන්න. (ලකුණු 06)

(iii) ඓන්ද්‍රිය කෘෂිකර්මාන්තයට යොමුවීම ආශ්‍රිතව ඇති වූ යහපත් බලපෑම් සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(iv) ලෝක කෘෂි නිෂ්පාදනයේ ප්‍රසාරණය අංශ 03 ක් යටතේ විස්තර කරන්න.

(ලකුණු 06)

08. (i) නූතන ලෝකය තුළ කලාපීය සංවිධානවල අවශ්‍යතාවයක් හඳුනාගත හැක. මෙම ප්‍රකාශය කෙටියෙන් පහදන්න. (ලකුණු 02)

(ii) වර්තමාන ගෝලීය අභියෝග ජය ගැනීමේදී කලාපීය සංවිධානවල අවශ්‍යතාවය ඉතා වැදගත් වේ. සාර්ක් සංවිධානයේ අරමුණු ඇසුරින් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(iii) යුරෝපා රටවල ආර්ථික අභියෝග ජය ගැනීමේදී යුරෝපා සංගමයේ කාර්යභාර්ය ඉතා වැදගත් වේ. යුරෝපා සංගමයේ ක්‍රියාකාරිත්වය පිළිබඳව සැකෙවින් පහදන්න. (ලකුණු 06)

(iv) ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පවතින ප්‍රාදේශීය අසමානතාවයන් අවම කිරීමේ වැදගත්කම ලෝක නායකයින් විසින් ඒකමතිකව අනුමත කළද එම අරමුණු සාක්ෂාත් කර ගැනීම සම්බන්ධයෙන් කලාපීය සංවිධාන විසින් දක්වා ඇත්තේ සුළු දායකත්වයකි. නිශ්චිත උදාහරණ දක්වමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 06)

***

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය -2024

General Certificate of Education (Advanced Level) Examination - 2024

| | |
|---|---|
| භූගෝල විද්‍යාව | I |
| புவியியல் | I |
| Geography | I |

22 S I



උඩුපළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව






ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

(16) WWW.PastPapers.WiKi (16)
Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!



PARCEL NO
LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්
PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න